සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Department of Education, Southern Province**

**පෙරහුරු පරීක්ෂණය - 2022/2023**

**13 - ශ්‍රේණිය** | **නාට්‍ය හා රංග කලාව 57 S (I)** | **පැය 03 යි**

**අමතර කියවීම් කාලය මිනිත්තු 10**

නම / විභාග අංකය ......................................................................................

- I කොටස - සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- II කොටස - A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන, ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු ලියන්න.

## I කොටස

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

1. ප්‍රාසාංගික කලාවක් නොවන්නේ,
   (1) මුද්‍රා නාට්‍යය යි. (2) ගීත නාට්‍යය යි. (3) සරඹ සන්දර්ශනය යි.
   (4) බැලේ ය (5) නාට්‍යය යි. ( )

2. රූපවාහිනිය ප්‍රචාරණය වන පැණි බීම වර්ගයක් ප්‍රවර්ධනයට යෙදෙන සංගීතමය, නාට්‍යානුරූපී වෙළඳ දැන්වීම,
   (1) ජනප්‍රිය කලාවකි. (2) ව්‍යවහාරික කලාවකි. (3) ලලිත කලාවකි.
   (4) ශිල්ප කලාවකි (5) ප්‍රාකෘතික කලාවකි. ( )

3. රිද්මයානුකූල චලන සමඟ අත් පා, ඇස්, මුහුණ මඟින් භාවයන් ප්‍රකාශ කරන නර්තන විශේෂය
   (1) ශුද්ධ නැටුමයි (2) නෘත්ත යි (3) නාටකයි
   (4) නාට්‍යයි (5) නෘත්‍ය යි ( )

4. ''නාට්‍ය යනු අවස්ථා අනුකරණය කිරීමකි'' යනුවෙන් නිර්වචනයක් සැපයූ විචාරකයා වනුයේ,
   (1) එදිරිවීර සරත්චන්ද්‍රයන් ය. (2) භරත මුණි ය. (3) අභිනව ගුප්ත ය.
   (4) ධනංජය යි. (5) භට්ටනායකය. ( )

5. සංස්කෘත නාට්‍ය කලාවේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ,
   (1) පරිශීලනය කරන්නා හට රසයක් ලබා දීම. (2) නළු කාර්යයට පුද්ගලයන් අවතීර්ණය කර ගැනීම.
   (3) දෙවියන්, රජුන්, ප්‍රභූන්ගේ චිත්ත සන්තර්පණය යි. (4) හුදී ජනයාගේ ප්‍රඥාව දියුණු කිරීම.
   (5) ප්‍රේක්ෂකයා සුඛාන්තයක් කරා යොමු කිරීමයි. ( )

6. නාට්‍ය ධර්මී ශෛලිය හා නොගැළපෙන ප්‍රකාශය වන්නේ,
   (1) ලාලිත්‍යයෙන් යුතු අංග වික්ෂේප දැකිය හැකිය. (2) තාලානුකූල ප්‍රවේශන හා නිෂ්ක්‍රමණ දැකිය හැකිය.
   (3) අස්වාභාවික ලෙස හැසිරෙන්නා වූ පාත්‍රයන් ඇසුරු කරයි. (4) විකෘත නොවූ පාත්‍රයන් දැකිය හැකිය.
   (5) පරිසරය හුවා දැක්වීමට දෙබස් හා මුද්‍රා භාවිත කරයි. ( )

7. ''විභාව'' යනු,
   (1) රසයක් ඉපදවීමට හේතුවන මනෝභාවය කි.
   (2) ස්ථායිභාවයක් අවදි කරවීමට හේතුකාරක වන්නා වූ සාධකයකි.
   (3) ස්ථායිභාවයට ප්‍රදර්ශනය කරන භාව ප්‍රකාශනයකි.
   (4) භාවයක් පිටතට ප්‍රකාශවන ආකාරයයි.
   (5) ස්ථායි භාවයක දී පහළ වන උපභාව විශේෂයකි. ( )

8. ''ඔබ කුවේණිය නම්, නාට්‍යාවසනයේ කුමක් කරයි ද?'' යන ක්ෂණික නිරූපණය මාතෘකාව ලැබුණු විට, ඔබ ප්‍රධාන වශයෙන් ම මෙහෙයවිය යුත්තේ,

(1) බුද්ධිය යි. (2) කාලය යි. (3) රූපන විධි යි.
(4) ස්මණය යි. (5) පරිකල්පනය යි. ( )

9. නාට්‍ය ඉදිරිපත් කරනු ලබන ශෛලිය හා අනුගත නොවිය හැකි සාධකය වන්නේ,

(1) සංවාද යි. (2) රංගාලෝකය යි. (3) අංගරචනා ය.
(4) සංගීතය යි. (5) ප්‍රවේශන ය. ( )

10. ''අනුකරණය''ට අදාළ නොවන ප්‍රකාශය,

(1) කුඩා දරුවන් තම මව, පියා මෙන් හැසිරීම අනුකරණයකි.
(2) ඈදී ප්‍රාකෘත ජනයාගේ අභිචාරවල ස්වභාව ධර්ම නියාමනයන් අනුකරණයකි.
(3) පන්ති කාමරයේ ශිෂ්‍යයා තම ගුරුවරයා අනුගමනය කිරීම අනුකරණයයි.
(4) යක්ෂ, දේව වැනි මනඃකල්පිත චරිත ද ශාන්තිකර්මවල දී අනුකරණය කරයි.
(5) යම් කෙනෙක් දෙස බලා ඒ ආකාරයෙන් ම හැසිරීම අනුකරණයක් නොවේ. ( )

- **පහත සඳහන් වචන අධ්‍යනය කොට අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**.

A ඉදානීංතනි B පාර්සි C බීජ D පද්මාවතී E ස්ථම්බ
F අරාල G ප්‍රාක්තනි H ප්‍රකරී I නේත්‍රෘ J වීර

11. සාත්ත්වික අභිනයට ඇතුළත් අවස්ථාවක වචනයක් වන්නේ,

(1) A ය. (2) D ය. (3) E ය. (4) G ය. (5) H ය. ( )

12. ටවර් ශාලාවට පෙර කොළඹ පැවැති තාවකාලික රංග ශාලාවක අක්ෂරය වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය. (5) E ය. ( )

13. විශ්වනාථ ට අනුව ප්‍රේක්ෂකයාගේ ජීවන අත්දැකීම් ''වාසනා'' ස්වරූපයෙන් තිබෙන අක්ෂර ද්විත්වය වන්නේ,

(1) A හා G ය. (2) E හා F ය. (3) B හා G ය. (4) I හා K ය. (5) G හා A ය.( )

14. සංස්කෘත නාට්‍යයේ භාවිත වන හස්ත මුද්‍රාවක නාමය සහිත අක්ෂරය වන්නේ,

(1) B ය. (2) C ය. (3) E ය. (4) F ය. (5) I ය. ( )

15, ශාකුන්තලයේ ධීවරයා හා සම්බන්ධ සිද්ධිය වස්තුව තුළ හඳුනා ගන්නේ,

(1) A ලෙසිනි. (2) C ලෙසිනි. (3) F ලෙසිනි. (4) H ලෙසිනි. (5) J ලෙසිනි ( )

16. ශ්‍රී ලංකාවේ නාට්‍යමය ලක්ෂණ ඇතුළත් බෞද්ධ පූජාකර්ම සම්බන්ධයෙන් සාවද්‍ය කරුණ වන්නේ,

(1) මැණික්පාල ශාන්තිය බෞද්ධ පූජාකර්මයකි.
(2) දොරකඩ අස්න බෞද්ධ පූජාකර්මයකි.
(3) ගිහියෙක් මිළිඳු රජතුමා ලෙස, මිලින්ද ප්‍රශ්නයේ සිටී.
(4) බෞද්ධ පූජාකර්මවල සමාරෝප අඩංගු වේ.
(5) ආලවක දමනය බෞද්ධ පූජාකර්මයකි. ( )

17. නළු කාර්යයට වේදිකාවට පිවිසෙන ඔබ, පහත කරුණු අතරින් අඩු ම අවධානයක් දිය හැකි කරුණ වන්නේ,

(1) වස්තු කාලය (2) පසුතල ස්ථානගත වීම (3) රංගලෝකයේ පතිත වීම්
(4) දෘෂ්ඨි රේඛාව (5) ප්‍රවේශන හා නිෂ්ක්‍රමණ ( )

18. අත්තල ක්‍රීඩාවේ සිදු නොකරන්නේ,

(1) අත් තළන ක්‍රම විවිධාකාරයට වෙනස් කරයි. (2) වැරදි අනුකරණය කළ සිසුන් ඉවත් නොකරයි.
(3) නායකයා අත්තල වාර ගණන වෙනස් කරයි. (4) නායකයා පළමුවෙන් ම අත්පුඩි කීපයක් ගසයි.
(5) වටේ සිටින සිසුන් අත්තල අනුකරණය කරයි. ( )

19. දෙබස් කීමේ දී අවධානයට ගත යුතු කරුණක් නොවන්නේ,

(1) රිද්මයේ වේගයයි.

(2) අධික ශබ්දයෙන් ප්‍රක්ෂේපණය යි

(3) රංගනයේ වේදිකාවේ සිටින අනෙක් චරිත හා ඒවායේ ස්වභාවය යි.

(4) එම අවස්ථාවේ නාට්‍යයේ පරිසරය යි.

(5) හඬතල භාවිතය යි ( )

20. නාට්‍යයේ ගැටුම සම්බන්ධයෙන් පිළිගත නොහැකි ප්‍රකාශය වන්නේ,

(1) සියලු නාට්‍ය බිහි වීමේ මූලික පදනම ගැටුමයි. (2) ගැටුම සෑම නාට්‍යයක ම පවතී.

(3) ගැටුම නාට්‍යයේ ආත්මයයි. (4) ගැටුම අන්තර්ගත වන්නේ කතා වස්තුව තුළයි.

(5) සෑම චරිතයක් ම ගැටුම වටා රොක් වෙති. ( )

- **ප්‍රශ්න අංක 21 - 25 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා කරුණු, සංකල්ප නාම පහ බැගින් දී ඇත. සෙසු පද හා නොගැළපෙන පදය තෝරා එහි අංකය වරහන තුළ ලියන්න.**

21. (1) කරළිය (2) පිළිප්පු සිඤ්ඤෝ (3) මද්දලය
(4) සී දොන් බස්තියන් (5) ඇහැලේපොළ ( )

22. (1) විනෝදාස්වාදය (2) පූජාර්ථය (3) සශ්‍රීකත්වය
(4) වින කැපීම (5) පත්තිනි පූජාව ( )

23. (1) කඩවුණු පොරොන්දුව (2) පිටිසර කෙල්ල (3) පෙරළෙන ඉරණම
(4) වැරදුණු කුරුමානම (5) කවට අන්දරේ ( )

24. (1) සබේ විදානේ (2) අණබෙර (3) පොලිස්
(4) හේවා (5) මරක්කල ( )

25. (1) සෙරිදෙෂි (2) සෙරිෆු (3) කකිවරි
(4) හනමිච්ි (5) මවරි බුතයි ( )

26. ''ඒ නිසා වෙන්ඩ ඇති ඇගේ නෑදෑයෝ ඇට ගල් ගහලා මරා දැම්මේ''ප්‍රකාශය සිදු කරන අවස්ථාවේ වේදිකාවේ සිටින පාත්‍රයින් වන්නේ,

(1) ජීවහත්ත හා දිසාල පමණි.

(2) දඩයක්කරු හා ජීවහත්ත පමණි.

(3) දඩයක්කරු, ජීවහත්ත, දිසාල ය.

(4) දඩයක්කරු, ජීවහත්ත, දිසාලා, කුවේණිය යි

(5) දඩයක්කරු, ජීවහත්ත, දිසාලා, කුවේණිය හා පූරක ය. ( )

27. කුවේණි නිෂ්පාදනය සම්බන්ධයෙන් සාවද්‍ය කරුණ වන්නේ,

(1) පූරකගේ චරිතය හෙන්රි ජයසේන සිදු කර ඇත.

(2) ලයනල් වෙන්ඩ් රඟහලේ පළමුවරට රඟ දැක්වීය.

(3) කුවේණිගේ චරිතය අනුලා මෙන්ඩිස් රඟපා ඇත.

(4) දෙවෙනි නිෂ්පාදනය ආරම්භ වූයේ හරියට ම 101 වැනි රැඟුමත් සමඟය.

(5) පළමු වරට රඟ දැක්වූයේ 1963 දී ය. ( )

- **ප්‍රශ්න අංක 28 - 29 රූප සටහන ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.**

28. රූපයට අදාල ශාන්තිකර්මයේ උපත් කතාවට සම්බන්ධ නොවන්නේ,
    (1) මහා සම්මත රජු ය. (2) පඬුවස්දෙව් රජු ය.
    (3) රාහු ඇසුරේන්ද්‍රයා ය. (4) විජය රජු ය.
    (5) මලය රජු ය. ( )

29. ඉහත 28 හි සඳහන් ශාන්තිකර්මයේ ප්‍රධාන රංග අලංකරණය වන්නේ,
    (1) අයිලය යි. (2) අටමගල යි. (3) සූනියම් වීදිය යි.
    (4) කපාල කුඩුවයි (5) පිල්លු වීදිය යි.



30. සන්නියකුම හා **නොගැළපෙන** ප්‍රකාශය වන්නේ,
    (1) යක්ෂයා උපහාසයට ලක් කරමින් අතුරයාගේ සිතේ බිය පහ කරයි.
    (2) සංඛපාල රජු, උපත් කතාව හා සම්බන්ධයි.
    (3) වක්‍රෝර්ති ප්‍රකාශන බහුල ව ඇත.
    (4) සූනියම් අවතාර තුන මේ නිරූපණය කරයි.
    (5) හාස්‍යයෝත්පාදන නාට්‍යයක ස්වරූපය ගනී. ( )


31. නිවසේ ගෘහාධිපති, දේවාදාසයෙකු ලෙස සාමාරෝපනය වී දමිළ ජනයාගේ නිවෙස්වල සිදුකරන පූජාව ඇතුළත් සංස්කෘතික උත්සවය වන්නේ
    (1) මහා ශිවරාත්‍රී උත්සවය යි. (2) දීපවාලි උත්සවය යි. (3) නවරාත්‍රී මංගල්‍යය යි.
    (4) හින්දු අලුත් අවුරුදු උත්සවය යි. (5) තෛපොංගල් ය. ( )

32. ''රාවනේසන්'' නාට්‍යයේ නිර්මාණකරුවා වන්නේ,
    (1) එම්. ශන්මුගලිංගම් ය. (2) එස්. මෞනගුරු ය. (3) එස්. විද්‍යානන්දන් ය.
    (4) චෝර්ණලිංගම් ය. (5) කේ. කනපතිපිල්ලේ ය. ( )

33. ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි නාට්‍ය කලාව පිළිබඳ පහත ප්‍රකාශ අතුරෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
    (1) 20 වන සියවස වන විට ස්වතන්ත්‍ර ඉංග්‍රීසි නාට්‍ය ලංකාවේ තිබුණි.
    (2) 20 වන සියවස වන විට ඇතැම් පාසල්වල ඉංග්‍රීසි නාට්‍ය බිහිවුණි.
    (3) Workshop players නාට්‍ය සංවිධානය රුවන්ති ඩී. චිකේරාගේ ය.
    (4) රොබට් පී. නිවුටන්, නියුමාන් ජුබාල්, 50 දශකයේ ඉංග්‍රීසි නාට්‍ය කලාවට ඉමහත් සේවයක් කළහ.
    (5) 1970 දශකයේ දී ඉංග්‍රීසි නාට්‍යයේ වර්ධනයක් ඇතිවිය. ( )

34. එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ කෘතියක් ඇසුරින් නිපදවුණු නාට්‍යය වන්නේ,
    (1) තාත්තා (2) ලියතඹරා (3) දෑස නිසා
    (4) ඉබිකට්ට (5) මා හේනේ රීරි යකා ( )

- **දී ඇති රූප සටහන ආශ්‍රයෙන් ප්‍රශ්න අංක 35 - 38 පිළිතුරු සපයන්න.**




35. ඉහත රූපයේ දක්වෙන රංග භූමියේ අංග A - E දක්වා පිළිවෙලින් ඇතුළත් වරණය වන්නේ,
    (1) බුතයි , අතොෂ , ජිඋතයිශ , හෂිගකරි , කගමි-නො-මා
    (2) කගමි-නො-ම , හෂිගකරි , අතොෂ , බුතයි , ජිඋතයිෂ
    (3) කගමි-නො-ම , අතොෂ , ජි උතයිෂ , බුතයි , හෂිගකරි
    (4) ජි උතයසි , හෂිගකරි , අතොෂ , බුතයි , කගම්-නො-ම
    (5) අතොෂ , ජි උතයිෂ , හෂිගකරි , බුතයි , කාගම්-නො-ම ( )

36. ඉහත රංග භූමියේ හයිෂි වාදක කණ්ඩායම රැඳී සිටින්නේ

(1) A හි ය (2) B හි ය. (3) C හි ය.

(4) D හි ය. (5) E හි ය. ( )

37. ඉහත රූපයේ දැක්වෙන නාට්‍ය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) ග්‍රීක සම්ප්‍රදාය මෙන් ම වෙස් මුහුණු පළඳින නාට්‍ය ක්‍රමයකි.

(2) නාට්‍ය රඟ පාන්නේ පිරිමින් පමණි.

(3) වෙස් මුහුණු නොපළඳින චරිත ද සිටී.

(4) හුදු රසස්වාදය මුල් වේ.

(5) මුහුණේ අභිනය ප්‍රකාශනය ප්‍රබල ය. ( )

38. ඉහත වේදිකාවේ රඟ නොදක්වන නාට්‍යයකි.

(1) සුමිද ගව (2) කන්ජින්චො (3) බුසු

(4 පළතුරු කැඩූ තවුසා (5) කිඹුල් කඳුලු ( )

39. ධර්මප්‍රිය ඩයස්ගේ නාට්‍ය නිර්මාණයක් වන්නේ,

(1) මගුල් කපුවා (2) මම නෙවෙයි වෙන කෙනෙක් (3) අතරමැදියා

(4) ගලේ පිපෙන මල් (5) ගිනි ගිනි මාලේ ( )

40. පහතින් නොගැළපෙන යුගලය තෝරන්න.

(1) පාර්ලිමන්ට් ජෝක්ස් - මැණිකේ අත්තනායක

(2) හෝ ගානා පොකුණ - ලූෂන් බුලත්සිංහල

(3) ද නිව්ස් පේපර් - සරත් කොතලාවල

(4) සිරි පැරකුම් - චාන්දනී සෙනෙවිරත්න

(5) ගෝල් - ජැක්සන් ඇන්තනී ( )

57 S (I) , II කොටස

- A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන, ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු ලියන්න.

## A කොටස

1. (1.) ''සංස්කෘත නාට්‍යයේ ප්‍රභවය'' පිළිබඳ මතවාදයක් ගෙන හැර දක්වන්න. (ලකුණු 04)

   (2.) සකුන්තලා නාට්‍ය රංග ගත කිරීමේ දී විදූෂකගේ භූමිකාවෙහි දායකත්වය කෙසේ ද? විමසන්න. (ලකුණු 05)

   (3.) අභිඥාන සාකුන්තලයේ වර්ණනා චාතුර්ය අවස්ථා තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

2. (1.) සංස්කෘත නාට්‍යයේ භාෂන විධි 4 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

   (2.) ''ඇතොරේ දුලබ වනා රමණී රුව දිලෙනා'' රජුට සකුන්තලා අතිශයින් ම ප්‍රසන්න ය. විමසන්න. (ලකුණු 05)

   (3.) කාලිදාසයන්ගේ සාකුන්තලයේ මූලික අභිප්‍රාය රස නිශ්පත්තිය ද? විවරණයක යෙදෙන්න. (ලකුණු 06)

3. (1.) කෙටි නාට්‍ය 4 ක් දක්වා. එහි අධ්‍යක්ෂ වරුන් ලියන්න. (ලකුණු 04)

   (2.) කෙටි නාට්‍ය නිෂ්පාදනයක් ''කුඩා වපසරියක ලොකු අස්වැන්නක්'' ලෙස දැක්වෙන්නේ ඇයි? උදාහරණ දෙමින් විමසන්න. (ලකුණු 05)

   (3.) කෙටි කතාවක් මූලාශ්‍ර කරගෙන කෙටි නාට්‍යයක් ලිවීමේ දී ඔබ සැලකිලිමත් විය යුතු කරුණු, ගැටලු හඳුන්වා දෙමින් පහදන්න. (ලකුණු 06)

## B කොටස

4. (1.) කුවේණි නාට්‍යයේ විනිසුරුගේ තීන්දුවේ දී අවසාන වශයෙන් කියා සිටින්නේ කුමක් ද? (ලකුණු 04)

   (2.) කුවේණි නාට්‍ය තුළින් කතුවරයා විජයාගමනයේ සාම්ප්‍රදායික දෘෂ්ඨිවාදය විනිවිද දකින්නේ කෙසේ ද? විමර්ශනය කරන්න. (ලකුණු 05)

   (3.) කුවේණි, ගෘෂා, නෝරා, සකුන්තලා ආදී කාන්තාවන් සැවොම ඉල්ලා සිටින්නෙ...... යි. ඉහත හිස්තැන පුරවා නාට්‍යවලින් උදාහරණ ගෙන සුදුසු මාතෘකාවක් යටතේ පුවත්පතකට ලිපියක් ලියන්න. (ලකුණු 06)

5. (1.) සොකරි නාට්‍යයේ දක්නට ඇති අනුරූපන අවස්ථා 4 ක් නම් කරන්න. (ලකුණු 04)

   (2.) ජන නාටකයක් ලෙස සොකරියේ සාමාජීය වටිනාකම් විමසන්න. (ලකුණු 05)

   (3.) පැරණි ජන නාටකයක් නූතන වේදිකාවට ගෙන ඒමේ දී සිදුවන වෙනස්කම්, අවධානය යොමු කළ යුතු කරුණු උදාහරණ දෙමින් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

6. (1.) මනමේ නාට්‍ය වේදිකා ගතවීමත් සමඟ නාට්‍ය කලාවේ ප්‍රවර්ධනයට එකතු වූ සාධාණීය ලක්ෂණ 4 ක් ලියන්න. (ලකුණු 04)

   (2.) 1960 න් පසු ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාව තුළ ලෝක ධර්මී ශෛලියේ ප්‍රවනතාව නාට්‍ය 5 ක් ඇසුරෙන් ගෙනහැර දක්වන්න.. (ලකුණු 05)

   (3.) කුවේණි නාට්‍ය, එතෙක් නාට්‍ය ක්ෂේත්‍රයේ සිදු කරන ලද පර්යේෂණවල කූඨප්‍රාප්තිය යි. මෙම කියමන නාට්‍ය ඇසුරෙන් සනාථ කරන්න. (ලකුණු 06)

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

පෙරහුරු පරීක්ෂණය - 2022/2023

13 - ශ්‍රේණිය | නාට්‍ය හා රංග කලාව 57 S (II) | පැය 03 යි

අමතර කියවීම් කාලය මිනිත්තු 10

නම / විභාග අංකය ..............................................................................................

- I කොටස - සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- II කොටස - A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන, ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු ලියන්න.

## I කොටස

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

1. ඩිතුරම්බොස් ගායනා කලාත්මක අගයකින් යුතුව සකස් කළේ,
   (1) තෙස්පීස් ය. (2) අරියොන් ය. (3) මෙනන්ඩ්‍රොස් ය.
   (4) සෝලෝන් ය. (5) පෙරියන්ඩර් ය. ( )

2. ග්‍රීක නාට්‍යයට දෙවන නළුවෙකු එක් කරන ලද්දේ
   (1) සොෆොක්ලීස් ය. (2) ඇරිස්ටොෆනීස් ය. (3) ඊස්කිලස් ය.
   (4) යුරිපිඩීස් ය. (5) ෆ්රුනිබෝස් ය. ( )

3. සටුර නාටක අතරින් දැනට සම්පූර්ණයෙන් ම ඉතිරි වී ඇති එක ම නාටකය වන්නේ,
   (1) කුක්ලෝප්ස් ය. (2) අබර්නියෝ ය (3) සාමය ය
   (4) ඉක්නෙව්ටාඉ ය. (5) දෙබරු ය. ( )

4. කුවේණි පුවතට තරමක් සමාන කාන්තාව දෙස ප්‍රගතිශීලි, යථාර්ථවාදී මනස යොමු කළ යුරිපිඩීස්ගේ නාට්‍යයක් වන්නේ,
   (1) ද ට්‍රොජන් විමෙන් ය. (2) අල්කිස්ටික් ය. (3) හිපොලීටස් ය.
   (4) බක්ඛයි ය. (5) මීඩියා ය. ( )

5. ඇරිස්ටොෆනිස් ගේ නාට්‍යවල ආවේණික අංගයක් නොවන්නේ
   (1) නාට්‍යවල දෙබස් හාස්‍ය හා උපහාසය ප්‍රබලව ඉස්මතු කරයි.
   (2) ඔහුගේ නාට්‍යවල ගායන වෘන්දය 24 කි.
   (3) දෙබස් සඳහා ව්‍යවහාර බස භාවිත කිරීම.
   (4) රංග භූමි මායාව නිතර බිඳිනු ලබයි.
   (5) සෑම නාට්‍යයකම ප්‍රභූ පුද්ගලයන් විවේචනය දැකිය හැකිය. ( )

6. ඇරිස්ටෝටල් සම්බන්ධයෙන් සාවද්‍ය කරුණක්,
   (1) Poetics ඇරිස්ටෝටල් ගේ ග්‍රන්ථයකි.
   (2) ක්‍රි.පූ. 384-322 කාලයේ ජීවත් වූ දාර්ශනිකයෙකි.
   (3) ප්ලේටෝගේ ශිෂ්‍යයෙකි.
   (4) සොෆොක්ලීස් හා සමකාලීනයෙකි.
   (5) මහා ඇලෙක්සැන්ඩර් රජුගේ ගුරුවරයා ද විය. ( )

7. ඊඩිපස් පුරානොක්තිය අනුව සාවද්‍ය වන්නේ,

(1) ඊඩිපස් තම පියා වන ලායුස් මරා දැමීය.

(2) ඩෙල්ෆි දෙව් මැදුරේ දී ළඳරු ඊඩිපස් කොරින්ත් ගොල්පලාට හමුවේ.

(3) දරුවා ඉපදීමට පෙර ම අසුබ නිමිත්තක් ඩෙල්ෆි දෙව්මැදුරෙන් ප්‍රකාශ වේ.

(4) පොලිබස් රජු, ඊඩිපස් දරුකමට හදාගත්හ.

(5) තිබයේ රජු ලායුස් ය. බිරිඳ යොකොස්ටා ය. ( )

8. ඊඩිපස් නාට්‍යයේ පශ්චාත් දෘෂ්ඨි කථන රීතිය භාවිතා වූ අවස්ථාවකට උදාහරණය නොවන්නේ,

(1) ඊඩිපස් - මහළු මිනිසා දුටුවා මා ඔහුගේ රියදුරා ට පහර දෙනු

(2) සොෆොස්ටා - මම දිවුරා කියමි. ඔහු කීවේ සොරමුලක් කියායි.

(3) ඊඩිපස් - මා ගියා අන්තිමේ පයිතෝහි දෙව්මැදුරට

(4) ඊඩිපස් - මම වෙමි ලොව පසිඳු ඊඩිපස්

(5) යොකොස්ටා - පීබස් දෙවිඳුගේ අනාවැකියක් විය. ලායුස් රජු සිමිත්පෙළු ( )

9. ''මේ බිම කිලිටි කරන කිලුටා තොපයි'' මෙම ප්‍රකාශය සිදු කරන්නේ,

(1) තෙරේසියාස් ය. (2) ඊඩිපස් ය. (3) ක්‍රයෝන් ය.

(4) පණිවිඩකරු ය. (5) ජොකොස්ටා ය. ( )

10. මිස්ටරි යන වදනෙහි අරුතක් නොවන්නේ

(1) ආගමික විශ්වාසය පදනම් ව ඇසිය යුතු අභිරහස්‍ය කාරණා යන්න

(2) සදාචාර යන අරුත (3) වෙළෙඳ හෝ ශිල්ප යන අරුත

(4) අද්භූතජනක යන අරුත (5) ගුප්ත බලය යන අරුත. ( )

11. Every man හෙවත් සකලජන නාට්‍යය

(1) මොරැලිටි වස්තුවකි. (2) මිරැකල් නාට්‍යයකි. (3) මිස්ටරි වස්තුවකි.

(4) ශේක්ස්පියර්ගේ නාට්‍යයකි. (5) ජේසු තුමාගේ උත්තානය ඇතුළත් වස්තුවකි ( )

12. මධ්‍යකාලීන යුරෝපයේ ශ්‍රේණි නාටක පෙන් වූ වේදිකා වර්ගයක් නොවන්නේ

(1) බහු වේදිකා (2) ජංගම රථ වේදිකාව (3) මන්දිරි වේදිකා

(4) දෙව්මැදුරු අභ්‍යන්තර වේදිකා (5) බූත් වේදිකාව ( )

13. විලියම් ශෙක්ස්පියර්ගේ ඛේදාත්මක නාට්‍යයක් නොවන්නේ

(1) රෝමියෝ ජුලියට් (2) මැක්බත් (3) කිං ලීයර්

(4) මර්චන්ට් ඔෆ් වෙනිස් (5) ඔතෙලෝ ( )

14. ''ඩොක්ටර් ෆවුස්ටස්'' නාට්‍ය රචනා කළ නාට්‍යකරුවා වන්නේ,

(1) තෝමස් කිඩ් ය. (2) ක්‍රිස්ටෝපර් මාලෝ ය. (3) බෙන් ජෝන්සන් ය.

(4) ශෙක්ස්පියර් ය. (5) ජෝන් ලයිලි ය. ( )

15. ජුලියස් සීසර් නාට්‍ය තුළ, සීසර් ජීවමානව පෙනී සිටින්නේ,

(1) එක් ජවනිකාවක පමණි. (2) ජවනික දෙකකට පමණි. (3) ජවනිකා තුනකට පමණි.

(4) ජවනිකා හතරකට පමණි. (5) ජවනිකා පහකට පමණි. ( )

16. ඉහත 15 නාට්‍යයේ ''රෝමය එක මිනිහෙකුට බිය විය යුතුද?'' යන ප්‍රකාශය කළේ

(1) බ්රූටස් ය. (2) සින්නා ය.

(3) ඩෙසියස් ය. (4) කස්කා ය .

(5) කැසියස් ය. ( )

17. ජුලියස් සීසර් නාට්‍යයේ සීසර්ට ඇතිවන විපතක පෙර නිමිත්තක් නොවනුයේ

(1) සිංහ ධේනුවක පාර මැද පැටවුන් වැදීම. (2) වළවල් කට ඇරී මිනී එළියට ඒම

(3) මෙටලස් සිම්බර්ගේ පෙත්සම

(4) කැලිෆර්නියාගේ සිහිනය සීසර්ගේ ප්‍රතිමාවෙන් ලේ දහාරා විදීම.

(5) කැලිෆර්නියාගේ සිහිනය නොතකා සෙනට් සභාවටයාමටසීසර් තීරණය කිරීම ( )

18. ස්ටැනිස්ල්විස්කිගේ රූපණය විධික්‍රමයේ ප්‍රබල ව අන්තර්ගත වන්නේ,

(1) සාමූහික රංගනය (2) අභ්‍යන්තර රංගනය (3) බාහිර රංගනය

(4) පශ්චාත් දෘෂ්ටි කථන රීතිය (5) පෙළ කියවීම ( )

19. ''නළුවා හෝ නිළිය රූපනයේ යෙදිය යුත්තේ ආවේශයකින් තොරව බුද්ධිමය ප්‍රතික්‍රියාවක් දක්වන්නෙකු ලෙස ප්‍රකාශ කළේ,

(1) ස්ටැනිස්ල්විස්කි ය. (2) ඉයුජින් අයනස්කො ය (3) යෙව්ගිනි ශ්වාන්ක්ස් ය.

(4) මේයර්හොල්ඩ් ය. (5) බර්ටෝල් බ්‍රෙෂ්ට් ය. ( )

- **පහත සඳහන් නාට්‍යකරුවන් අධ්‍යයනය කොට අංක 20-24 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A ගොයෙතෙ B ආන්ද්‍රෙ අන්තොයින් C බර්ටෝල් බ්‍රෙෂ්ට්

D එමිල් සෝලා E ඇලෙක්සැන්ඩර් ඩුමා F ඔගස්ටස් ස්ට්‍රින්බර්ග්

G සැමුවෙල් බෙකට් H ඇන්ටන් චෙකොෆ් I මැක්සිම් ගෝර්කි

20. බුද්ධියට වඩා භාවයට ප්‍රමුඛත්වයක් ලෙස දෙන ''ප්‍රේමණීය නාට්‍ය'' කරුවන් වන්නේ,

(1) A , I ය. (2) G, H ය. (3) D, H ය. (4) A, E ය. (5) H, I ය. ( )

21. නාට්‍යෝපකරණ පරම ස්වභාවික ලෙස තැන්පත් කළ නාට්‍ය සම්ප්‍රදායේ පුරෝගාමියා ලෙස සැලකිය යුත්තේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය. (5) E ය. ( )

22. ස්වප්න නාටකය, අවතාර සොනාටාව නාට්‍යයන් කාගේ ද?

(1) A ය. (2) B ය. (3) D ය. (4) F ය. (5) G ය. ( )

23. විසංගති නාට්‍ය කරුවෙකු වන්නේ,

(1) A ය. (2) B ය. (3) G ය. (4) H ය. (5) I ය. ( )

24. යථාර්ථ වාදී රීතියේ නාට්‍යකරුවන් යුගලය වන්නේ,

(1) A, E ය. (2) D, E ය. (3) H, I ය. (4) F, H ය. (5) B, C ය. ( )

25. පහත සඳහන් නාට්‍ය කරුවන් ඔවුන් ජීවත් වූ කාල වකවානුව අනුව මුල සිට අගට පිළිවෙලින් පෙළගස්වා ඇති වරණය වනුයේ,

A සොෆොක්ලීස් B ශෙක්ස්පියර් C ඇරිස්ටෝෆනීස් D ඇල්බෙයාකැමූ E යෙව්ගින් ෂ්වාර්ට්ස්

(1) A, C, B, D, E (2) A, C, B, E, D (3) C, A, B, E, D

(4) C, A, E, D, B (5) A, C, E, D, B ( )

26. පහත (i), (ii), (iii) යටතේ සංවාද කීපයක් ද, A B හා C ලෙස නාට්‍ය කීපයක් ද දක්වා ඇත.

i. ''මේ කඳුළු ආදරය වෙනුවෙන්''

ii. ''දරුවෙනි, කිමෙක් ද මේ ආයාචනය''

iii. ''කෝටියක් ගැනු එහෙම කරලා තියෙනවා''

A ජුලියස් සීසර් B රූකඩ ගෙදර C ඊඩිපස්

ඉහත (i), (ii), (iii) සංවාද අන්තර්ගත නාට්‍ය අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) ACB (2) ABC (3) BAC (4) BCA (5) CBA ( )

27. ග්‍රීක රංගයේ දැක ගත නොහැකි දෙයක් වනුයේ,

(1) විශාල වෙස් මුහුණ (2) මළ මිනී (3) ඝාතනය
(4) වහළයේ රංගනය (5) ලද අඩි උස පාවහන් ( )

28. ළමා නාට්‍ය කලාවට සම්බන්ධව පහත සඳහන් වරණ වලින් නිවැරදි වරණය තෝරන්න.

(1) ළමා නාට්‍යයට ඊට විශේෂ වූ ගති ලක්ෂණ අවශ්‍ය නැත.
(2) වයස් කාණ්ඩවටල ආවේණික චර්යා රටා ළමා නාට්‍ය සඳහා වැදගත් නොවේ.
(3) ළමුන්ගේ හැකියා, සිතුම් පැතුම්, චර්යා වැදගත් නොවේ.
(4) ළමයින් රඟ දක්වන්නා වූ නාට්‍ය ළමා නාට්‍ය වේ.
(5) ළමයා උදෙසා ම නිර්මාණය සිදුවීම අවශ්‍ය නැත. ( )

29. ලව්නේරිස් හා නන්දාවතී යන චරිත ද්විත්වය ඇතුළත් ලාංකේය නාට්‍යයේ මුල් කෘතිය වන්නේ

(1) ද මැරේජ් (2) ද චෙරි ඕමාර්ඩ් (3) ද ග්ලාස් මෙනාජරි
(4) ද ප්‍රපෝසල් (5) ද ෆාදර් ( )

- **පහත ඡායාරූපය ආශ්‍රයෙන් 30 - 33 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



30. රූපයේ ඇති නාට්‍යයේ ''නත්තල් ගස'' වඩාත් ම ගැළපෙන නාට්‍යෝපකරණ වර්ගය වන්නේ,

(1) Set props (2) Hand props
(3) Decorative props (4) Personal props
(5) Blind props ( )

31. ඉහත නාට්‍යයේ ණය ගනුදෙනුව ඇතුළත් ලිපිය ලියුම් පෙට්ටියට දැමුවේ කවුද?

(1) ලින්ඩෙ මිය යි (2) රන්ක් ය (3) නුවුරා ය
(4) කෘග්ස්ටඩ් ය (5) හෙල්මර් ය ( )

32. ඉහත නාට්‍යයේ ප්‍රධාන චරිතය ණය මුදල පියවීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ගයක් නොවන්නේ,

(1) ලියුම් පිටපත් කොට අමතර ආදායමක් ලැබීම.
(2) හෙල්මර්, තමාගේ ඇඳුම් පැළඳුම්වලට දෙන මුදල් දරුවන්ට වියදම් කිරීම
(3) දොස්තර රන්ක්ගෙන් උදව් ගැනීම.
(4) තමාට ලාබ ඇඳුම් ගැනීම.
(5) ගෙදර වියදම් අරපිරිමැස්මෙන් සිදු කිරීම ( )

33. ඉහත නාට්‍ය කලාව බිහි වීමට බලපෑ කරුණක් නොවන්නේ,

(1) රාජානුග්‍රහය (2) ආගමික වෙනස්වීම් (3) වැඩවසම් ක්‍රමය වෙනස් වීම
(4) චිත්‍ර කලා ප්‍රබෝධය (5) විද්‍යා ප්‍රබෝධය ( )

34. නෝරාගේ භූමිකාවක් නොවන්නේ,

(1) මවක (2) බිරිඳක (3) මිතුරියක
(4) ආත්ම නිදහස පතන කාන්තාවක (5) බැංකු සේවිකාවක ( )

35. ඔපෙරා සම්බන්ධ ව නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) නාට්‍යමය අන්තර්ගතයක් නැත. (2) ප්‍රාසාංගික ලක්ෂණ ඉතා අවමය.
(3) එංගලන්තයේ ප්‍රභවය වේ. (4) ගායනය හා චලනය ප්‍රධාන වේ.
(5) ඔපෙරා නැරඹීම ප්‍රභූ පැලැන්තියට සීමා වේ. ( )

36. නාට්‍ය සංගීතය පිළිබඳ නිවැරදි ප්‍රකාශයක් වන්නේ,

(1) නාට්‍ය සංගීතයේ දී ගීත අත්‍යවශ්‍ය වේ. (2) නාට්‍ය සංගීතය රංග පරම විය යුතුය.

(3) සංගීතය අභිනයකි. (4) ශෝකාත්මයට සංගීතය අදාළ නොවේ.

(5) පසුබිම් සංගීතය නාට්‍ය සංගීතයට අදාල නොවේ. ( )

- **ප්‍රශ්න අංක 37 - 40 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා කරුණු, සංකල්පන, නාම පහ බැගින් දී ඇත. සෙසු පද හා නොගැළපෙන පදය තෝරා එහි අංකය වරහන තුළ ලියන්න.**

37. (1) කස්කා (2) ඔක්ටේවියස් (3) සින්නා
(4) කැසියස් (5) බ්රූටස් ( )

38. (1) තොල් (2) නළල (3) ඇස්
(4) කට (5) නිකට ( )

39. (1) සැවෝයි (2) ෆෝචූන් (3) ග්ලොබ්
(4) ස්වෝන් (5) රෝස් ( )

40. (1) Bandows (2) Par Can (3) Dimmer
(4) Light stand (5) Gobo's ( )

57 S (I) , II කොටස

- A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ගෙන, ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු ලියන්න.

## A කොටස

1. (1.) ඇරිස්ටෝටල්ට අනුව, ශෝකෝත්පාදකයේ මූලිකාංග නම් කරන්න. (ලකුණු 04)

   (2.) ග්‍රීක නාට්‍යයේ ප්‍රේක්ෂාව සකස්වීම කෙරෙහි රංගභූමියේ පිහිටීම බලපා ඇති ආකාරය කෙසේද? (ලකුණු 05)

   (3.) ග්‍රීක ශෝකාත්ම නාට්‍යයේ දක්නට ඇති ත්‍රිවිධ ඒකත්ව හඳුන්වා එහි භාවිතාව උදාහරණ සහිත ව විමර්ශනය කරන්න. (ලකුණු 06)

2. (1.) සොෆොක්ලීස්ගේ නාට්‍යවල දැකිය හැකි විශේෂ ලක්ෂණ 4ක් දක්වන්න. (ලකුණු 04)

   (2.) පාලකයෙකු සතු සාධණීය ලක්‍ෂණ, ඊඩිපස් රජ චරිතය නාට්‍යයේ විකාශනය වන ආකාරය අනුව පැහැදිලි කරන්න. (ලකුණු 05)

   (3.) සොෆොක්ලීස්ගේ ඊඩිපස් රජ නාට්‍ය සර්වකාලීන ද? විමසන්න. (ලකුණු 06)

3. (1.) නාට්‍ය නිෂ්පාදන ක්‍රියාවලියේ පියවර සැකවින් විමසන්න. (ලකුණු 05)

   (2.) නාට්‍යයක් සඳහා නළු නිළියන් තෝරා ගැනීමේ දී අධ්‍යක්‍ෂවරයා සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද? (ලකුණු 05)

   (3.) නළුවෙකුට නිර්මාණාත්මක ව චරිතයක් ගොඩ නැගීමේ දී පරිකල්පනයේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 05)

## B කොටස

4. (1.) රූකඩ ගෙදර නාට්‍යයේ නෝරාගේ හා හෙල්මගේ චරිත ලක්ෂණ 4 බැගින් ලියන්න. (ලකුණු 04)

   (2.) ''දරුවන්ගේ මව'' නමැති භූමිකාවට නෝරා සාධාරණයක් කරන්නේ ද? නාට්‍යයෙන් උදාහරණ ගෙන ඔබේ අදහස ඉදිරිපත් කරන්න. (ලකුණු 05)

   (3.) ''නෝරා සොයා යන විමුක්තියට හේතුවන්නේ ටෝවල්ඩ්ගේ හැසිරීමයි.' විමසන්න. (ලකුණු 06)

5. (1.) ශේක්ස්පියර්ගේ තම නාට්‍ය සඳහා යොදා ගත් මූලාශ්‍ර 3 ක් නම් කර, එම මූලාශ්‍ර ඇසුරෙන් රචනා කළ නාට්‍ය කෘතිය බැගින් ලියන්න. (ලකුණු 03)

   (2.) ශේක්ස්පියර්ගේ නාට්‍ය කලාවේ දක්නට ලැබෙන පොදු ලක්ෂණ ජුලියස් සීසර් නාට්‍ය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

   (3.) ජුලියස් සීසර් නාට්‍ය රංග වස්ත්‍ර හා රංගෝපකරණ නිර්මාණය පිළිබඳ විමසුමක්, චරිත 4 ක් ආශ්‍රයෙන් ගෙනහැර දක්වන්න. (ලකුණු 07)

6. (1.) ජුලියස් සීසර් නාට්‍යයේ හඳුනාගත හැකි තේමා හතරක් ලියන්න. (ලකුණු 04)

   (2.) ජුලියස් සීසර් නාට්‍යයේ ''බ්‍රූටස් උතුම් අරමුණු ඇත්තෙකි.'' විමසන්න. (ලකුණු 05)

   (3.) ජුලියස් සීසර් නාට්‍යයේ අවමගුල් දේශනයක් ගෙන එහිදී මහජනයාගේ ප්‍රතිචාර පැහැදිලි කරමින් සාකච්ඡාවක් ගොඩනගන්න. (ලකුණු 06)